**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2019**

---------------------------------------------------------------

සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 ඔක්තෝබර් 26 දින එළඹි පිළිවෙලින් අංක 3727-එස්ආර්අයි(සීඔඑල්) සහ අංක 0618- එස්ආර්අයි(එස්එෆ්) දරන ණය හා ප්‍රදාන ගිවිසුම්වල iv වාවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------

ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය එවකට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මධ්‍යම, උතුරු මැද, සබරගමුව හා ඌව පළාත්, පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, ගුණාත්මක අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සඳහා විශ්වීය ප්‍රවේශය සහ අඛණ්ඩව රැකවරණය සැපයීම යන සංකල්පය මත පදනම්ව ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතියේ කාර්යක්ෂමතාව, සමානාත්මතාවය සහ ප්‍රතිචාරාත්මක බව වැඩි දියුණු කිරීම වේ. (අ) මධ්‍යම, උතුරු මැද, සබරගමුව සහ ඌව පළාත්වල ප්‍රාථමික සෞඛ්‍ය සේවා වැඩි දියුණු කිරීම (ආ) සෞඛ්‍ය තොරතුරු පද්ධතිය සහ රෝග නිරීක්ෂණ ධාරිතාව ශක්තිමත් කිරීම, ප්‍රතිපත්ති සංවර්ධනය, ධාරිතා වර්ධනය සහ (ඇ) ව්‍යාපෘති කළමනාකරණ සහාය නමින් වූ සංරචක තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය සහ ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,300 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 60 ක් වන අතර ඉන් ණය වශයෙන් රු.මිලියන 5,812 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 37.50 ක්ද ප්‍රදාන වශයෙන් වූ රු.මිලියන 1,938 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 12.5 ක්ද මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල වූ රු.මිලියන 1,550 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 10 ක් ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 දෙසැම්බර් 01 දින ආරම්භ කර තිබුණු අතර 2023 නොවැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

------

මූල්‍ය ප්‍රකශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 9.3 ඡේදය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ කමිටුව එක් වරක් පමණක් රැස්ව තිබුණි. | චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කිරීම. | ප්‍රයෝගිකව, සාමාජිකයින් රැස්වීම්වලට සහභාගී කරවා ගැනීම ඉතා අපහසු වේ. | මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

---

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

---

| ක්‍රියාකාරකම | 2019 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනය | අත්කරගත් කාර්ය සාධනය | විගණන නිරීක්ෂණය | ප්‍රමාද වීමට හේතු |
|---|---|---|---|---|
| | ඒකක | ඒකක | | |
| උපකරණ සහ උපදේශන සේවා ආදිය මිලදී ගැනීම. | 28 | 23 | ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 176.31 ක් වූ ප්‍රසම්පාදන 05 ක ලංසු කැඳවීමේ ක්‍රියාපටිපාටිය දින 04 සිට 92 දක්වා ප්‍රමාද වී තිබුණි. | ව්‍යාපෘති කටයුතු සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ දුර්වලතා. |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** පිරිවිතරයන් සකස් කිරීම සඳහා උපදේශකයින්ගේ සහාය ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ප්‍රමාද විය. තවද දුරස්ථ අධ්‍යාපනය සඳහා ජාත්‍යන්තර උපදේශන ලබා ගැනීමේ ප්‍රසම්පාදනය 2023 දක්වා කල් තබනු ලැබීය.

**විගණකගේ නිර්දේශ** ව්‍යාපෘති කටයුතු නියමිත වේලාවට සැලසුම් කර අවසන් කළ යුතුය.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සැලසුම් හා අධීක්ෂණ උපදේශන ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | බලපෑම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | උපදේශන සේවා තෝරා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 ඡේදය ප්‍රකාරව, අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද උපදේශක ප්‍රසම්පාදන කමිටුවක් පත්කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ අධීක්ෂණය යටතේ ප්‍රසම්පාදනයට අදාළ ප්‍රසම්පාදන කොන්දේසි (Terms of Reference), මුළු පිරිවැය ඇස්තමේන්තු සහ සැපයුම්කරුවන්ගෙන් කැමැත්ත විමසීමට අදාළ ලිපිලේඛණ (Expression of Interest) පිළියෙල කර නොතිබුණි. | උපදේශන සේවා තෝරා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනි වීම. | අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද උපදේශක ප්‍රසම්පාදන කමිටුව පත් කරන තෙක් අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදනයේ මූලික කටයුතු සිදු කර ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ආරම්භයේදීම අදාළ ප්‍රසම්පාදන කමිටුව පත් කළ යුතු අතර සමස්ථ ක්‍රියාවලිය සඳහා කමිටුව වගකිව යුතුය. |
| (ආ) | උපදේශන සේවා තෝරා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.1 ඡේදය ප්‍රකාරව, ගුණාත්මක හා පිරිවැය පදනම් කරගත් තෝරා ගැනීමේ ප්‍රසම්පාදනයක් (QCBS) සඳහා සම්මත කාලය සති 20 ක් විය. කෙසේ වෙතත්, ඉහත සඳහන් ප්‍රසම්පාදනය සඳහා වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණි. | අකාර්යක්ෂමතාව | ප්‍රසම්පාදන කමිටුවට පාලනය කළ නොහැකි, ප්‍රායෝගිකව අනුමැතිය ලබා ගැනීමට ගතවන කාලය මෙයට හේතුවේ. | මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදනය කාර්යක්ෂමව සිදු කළ යුතුය. |
| (ඇ) | උපදේශන සේවා තෝරා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය ප්‍රකාරව, ප්‍රසම්පාදන පිරිවැය ඇස්තමේන්තුව යථාර්ථවාදී අයවැය ප්‍රතිපාදන වලට අනුකූලව පිළියෙල කළ යුතුය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුවේ ආරම්භක පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 150.35 ක් වූ අතර තත්‍ය වටිනාකම රු.මිලියන 320.41 දක්වා සියයට 113 කින් වැඩිවී තිබුණි. | පිරිවැය ඉක්මවයාම | ප්‍රසම්පාදනය සැලසුම් කර ඇත්තේ ව්‍යාපෘති සැලසුම් කිරීමේ කාල සීමාව තුළ වන අතර එබැවින් උපකල්පන මත ඇස්තමේන්තු පිළියෙල කර ඇත. | පිරිවැය ඇස්තමේන්තුව යතාර්ථවාදීව සකස් කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

| විගණන නිරීක්ෂණය | බලපෑම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) ප්‍රසම්පාදන සැලැස්මට අනුව, රේඛීය අමාත්‍යාංශය සහ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා සඳහා වාහන 05 ක් ඇතුළුව මෝටර් රථ 67 ක් මිලදී ගැනීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් රු.මිලියන 8.18 ක් වැය කරමින් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට සහ ව්‍යාපෘති කාර්යාලයට සමාලෝචිත වර්ෂය තුළදී වාහන 02 ක් කුලියට ගෙන තිබුණි. | ව්‍යාපෘතියට අමතර පිරිවැයක් දැරීමට සිදුවීම | ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් විශේෂ අනුමැතියක් ලබා ගන්නා ලදී. 2019 නොවැම්බර් 11 දින ප්‍රසම්පාදන දැන්වීම පළකර ඇත. | අමතර වියදම් කපාහැරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය වේගවත් කළ යුතුය. |
| (ආ) ධාරිතා වර්ධන වැඩසටහන මුළු ව්‍යාපෘති කාලය තුළම අඛණ්ඩව පවත්වාගෙන යාමට සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 340 ට සමාන ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 2 ක් වෙන් කර තිබුණි. පහත නිරීක්ෂණන් කරනු ලැබේ. | | | |
| (i) ව්‍යාපෘතිය විසින් සමස්ථ පුහුණු සැලැස්මේ සියයට 0.11 ක් පමණක් නියෝජනය වන රු.මිලියන 0.67 ක මුදලක් වැය කරමින් දේශීය පුහුණු වැඩසටහන් යටතේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 52 දෙනෙකු සඳහා දින දෙකක මූල්‍ය හා ප්‍රසම්පාදන පුහුණු වැඩසටහනක් පැවැත්වීම හැරුණු විට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු පුහුණු වැඩසටහනක් පවත්වා නොතිබුණි. | ව්‍යාපෘති ඉලක්ක සපුරා ගත නොහැකිවීම. | යාවත්කාලීන කරන ලද පුහුණු සැලැස්ම එකඟතාවය ලබාගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ ආසියානු සංවර්ධන බැංකුවට ඉදිරිපත් කිරීම ප්‍රමාදවී තිබුණි. එම වැඩසටහන් සඳහා අයදුම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් විදේශීය පුහුණු කිරීම් ප්‍රමාදවී ඇත. | ව්‍යාපෘති කාලය තුළ ව්‍යාපෘති කටයුතු ක්‍රමානුකූලව අවසන් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2019 සිට 2023 දක්වා වූ මානව සම්පත් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වූ මාර්ගෝපදේශයේ 08 වන ඡේදයට අනුව වාර්ෂික මානව සම්පත් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පෙර ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව විසින් අනුමත කළ යුතු වුවද, 2019 වර්ෂය සඳහා වූ මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුමත කිරීම 2020 පෙබරවාරි 18 දින දක්වා ප්‍රමාද වී තිබුණි. ඒ අනුව, 2019 වර්ෂය තුළ ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද දේශීය පුහුණු වැඩසටහන ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ අනුමැතියකින් තොරව පවත්වා තිබුණි. | නීති හා රෙගුලාසිවලට පටහැනිවීම. | මෙම පුහුණු වැඩසටහන් ඇතුළුව ප්‍රධාන මානව සම්පත් සංවර්ධන සැලැස්ම සඳහා මෙහෙයුම් කමිටුවේ අනුමැතිය 2020 පෙබරවාරි 18 දින ලබාගෙන ඇත. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පෙර ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (iii) | මානව සම්පත් සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සඳහා වූ මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමට නියමිත පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් මානව සම්පත් සංවර්ධන කමිටුවක් පත් කළ යුතු වුවද, කමිටුව පත් කිරීම 2019 ඔක්තෝබර් 25 දින දක්වා ප්‍රමාදවී තිබුණි. කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි. | නීති හා රෙගුලාසිවලට පටහැනිවීම. | අනාගත පුහුණු වැඩසටහන් සඳහා අනුමැතිය ලබා ගැනීමට පියවර ගනු ලැබේ. | ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුව පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන කමිටුව පත් කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණයට අදාළ නිරීක්ෂණ

| සේවක තනතුර | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| අභ්‍යන්තර විගණක | ව්‍යාපෘතිය සඳහා ස්ථිර පදනමක් මත අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2018 දෙසැම්බර් 14 දින ලැබී තිබුණද, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරියා වැඩබලන පදනම මත අභ්‍යන්තර විගණක ලෙස බඳවාගෙන තිබුණි. | අපේක්ෂිත රාජකාරිය ඉටු නොවිය හැකිය. | තෝරාගත් නිලධාරියා පූර්ණ කාලීන රාජකාරියට නිදහස් කළ නොහැකි බැවින් ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය ඇතිව අර්ධකාලීන පදනමින් පත් කරන ලදී. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පරිදි අභ්‍යන්තර විගණක ස්ථිර පදනමින් පත් කළ යුතුය. |

## 3.5 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| රු. මිලියන 19.67 ක වියදමින් මිලදී ගත් දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධ භාණ්ඩ සමීක්ෂණ ව්‍යාපෘති කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර නොතිබුණි. | ව්‍යාපෘති වත්කම් අනිසි ලෙස භාවිතා කිරීමට හැකිවීම | සත්‍යාපනය අවසන් වූ වහාම වාර්තාව ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් අනුව වත්කම් සත්‍යාපනය කළ යුතුය. |